# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.04.04 පැය 1430 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 642 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.

2015.07.09 වන දින පමුණුගම පොලිස් වසමේ පුබුදුගම ප්‍රදේශයේදී ආරවුලක් හේතුවෙන් පුරුෂයා විසින් බිරිඳගේ හිසට පෙට්‍රල් දමා ගිනි තබා බරපතල තුවාල සිදුකර මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමේ අපරාධය සම්බන්ධයෙන් පමුණුගම පොලිස් ස්ථානය මගින් විමශර්න ආරම්භ කර තිබුණි.

මෙම අපරාධය සම්බන්ධයෙන් පමුණුගම පොලිසිය විසින් දීඝර් ලෙස විමශර්න සිදුකර වත්තල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාතර්ා කර ඇත. මෙම සිද්ධියෙන් පසු සැකකරු ප්‍රදේශය මගහැර පලාගොස් සිට ඇති අතර සැකකරුට 2019.12.18 වන දින වත්තල ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් විවෘත වරෙන්තු නිකුත් වී තිබිණි.

මෙම අපරාධයට සම්බන්ධ සැකකරු පිළිබඳව පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරින්ට ලද තොරතුරක් අනුව 2025.04.03 වන දින මෙම මනුෂ්‍ය ඝාතනයට සම්බන්ධ සැකකරු දෙහිවල පොලිස් වසමේ ෆෙයාලර්යින් පාර ප්‍රදේශයේ සැඟව සිටියදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන මෝදරවිල, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - හබරාදූව පොලිස් වසම.

2025.04.03 වන දින උදෑසන කාලයේ හබරාදූව පොලිස් වසමේ දූවමළලගම ප්‍රදේශයේ කොග්ගල ඔයේ නාඳුනන පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට හබරාදූව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර උස අඩි 05 අඟල් 06ක් පමණ වූ උඩු කයට කොලර් සහිත ටීෂටර් එකක් හැඳ සිට ඇති අතර යටිකය නිරුවත්ව ඇත.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හබරාදූව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.04.03 වන දින කාලයේ සවස් පොලිස් වසමේ ස්ටේස්පුර ප්‍රදේශයේදී කොළම අපරාධ කොට්ඨාසයේ බස්නාහිර පළාත් දූෂණ මර්දන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 840 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වූ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. පස් කන්දක් කඩා වැටී පුද්ගලයින් දෙදෙනෙකු මියයාමක් - ඇලපාත පොලිස් වසම.**

2025.04.03 වන දින දහවල් කාලයේ ඇලපාත පොලිස් වසමේ දම්බුළුවන ප්‍රදේශයේදී පුද්ගලික ඉඩමක පවත්වාගෙන යනු ලබන බලපත්‍ර සහිත බැකෝ යන්ත්‍රයක් යොදා ගෙන කපන ලද පතලක සේවය කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු පැරණි තට්ටු පතලක දෝනාවකට පස් කන්ඩියක් ගිලා බැසීම හේතුවෙන් එයට යටවී මියගොස් ඇති බවට ඇලපාත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මියගිය අයවලුන් වයස අවුරුදු 37 හා 42 යන වයස්වල පසුවන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**මෘත ශරීර රත්නපුර රෝහලේ මෘතශරිරාගරායේ තැන්පත් කර ඇත.** ඇලපාත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**